# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ
# மாவட்ட செயலகம் - கொழும்பு
# DISTRICT SECRETARIAT – COLOMBO

ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 எல்விடிகல மாவத்தை, நாராஹென்பிட்ட, கொழும்பு 05 Elvitigala Mw, Narahenpita, Colombo 05

ඊ මේල් ஈ மெயில் E-mail: ds@colombo.dist.gov.lk වෙබ් අඩවිය வெப் தளம் Web site: colombo.dist.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DIST.CMB./ACC06/PRO/17./2025 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2025.10.31 |

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ,

## භාණ්ඩ, වැඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

02. 2026 සැපයුම්කරුවන් ලියාපදිංචිය මෙම වර්ෂයේදී ද කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවිය ( **www.colombo.dist.gov.lk** ) මගින් මාර්ගගත **(Online)** **ක්‍රමවේදය ඔස්සේ පමණක්** සිදු කිරීමට කටයුතු සිදු කර ඇති අතර ලියාපදිංචියට අදාල සියළු විස්තර එම වෙබ් අඩවිය මගින් බාගත කර ගත හැකි බවද කාරුණිකව සඳහන් කරමි.

03. ඊට අදාල දැන්වීම 2025.10.30 දින දිනමිණ, ඩේලිනිව්ස් සහ තිණකරන් යන පුවත්පත්වල තෙයිභාෂාවෙන් පල කර ඇති අතර ලියාපදිංචිය, **2025 ඔක්තෝම්බර් 31** දින පෙ.ව. **09.00** සිට **2025** දෙසැම්බර් **15** දින ප.ව. **4.00** දක්වා බවද කාරුණිකව දන්වා සිටිමි.( පුවත්පත් දැන්වීම ද මේ සමඟ අමුණා ඇත.)

04. මේ සම්බන්ධව තොරතුරු දැනගැනීම සඳහා පහත දුරකථන අංක අමතන්න.

වැඩිදුර විමසීම් - හර්ෂණී මිය 070 - 1045433<br>011 - 2368153

ප්‍රධාන ගණකාධිකාරී,<br>
දිසාපති / දිස්ත්‍රික් ලේකම් වෙනුවට,<br>
කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය.

BC) 3X70+54.6+16sqmm | 14.00 පැය | 223432

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
## කොළඹ

## භාණ්ඩ, වැඩ සහ සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2026 වර්ෂය

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 වෙනුවෙන් 2026 වසර සඳහා භාණ්ඩ, වැඩ සහ සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කරනු ලැබේ.

**ලියාපදිංචියට අදාළ ප්‍රධාන කාණ්ඩ පහත පරිදි වේ.**

1. යන්ත්‍ර සූත්‍ර
2. පරිගණක, පරිගණක උපාංග සහ ජාලකරණය
3. කාර්යාල උපකරණ
4. කාර්යාල ලිපි ද්‍රව්‍ය, ටෝනර් වර්ග
5. ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සහ සකස් කිරීම
6. මුද්‍රණ කටයුතු හා ප්‍රචාරක අයිතම
7. ගොඩනැගිලි ද්‍රව්‍ය
8. රෙදිපිළි සහ සම්භාණ්ඩ
9. ක්‍රීඩා භාණ්ඩ
10. රථ වාහන අවශ්‍යතා
11. සේවා සැපයීම්
12. අලුත්වැඩියා
13. උත්සව හා සුභසාධන භාණ්ඩ මිලට ගැනීම සහ කුලියට ගැනීම
14. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්
15. ආහාරපාන සැපයීම
16. පැළ තවාන් සහ කෘෂි උපකරණ
17. විෂබීජ නාශක ද්‍රව්‍ය සහ වෙනත් මිලදී ගැනීම්

02. ඒ අනුව **www.Colombo.dist.gov.lk** යන වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගත (Online) ක්‍රමවේදය මගින් පමණක් අයදුම්පත් පුරවා එක් කාර්යාලයක එක් ප්‍රධාන කාණ්ඩයක් සඳහා ආපසු නොගෙවන රු. 500.00 ක මුදලක් දිස්ත්‍රික් ලේකම් - කොළඹ නමින් ඇති අංක 7041682 දරන ලංකා බැංකු ගිණුම් අංකයට මුදල් ගෙවා ලබා ගත් තැන්පතු පත්‍රිකාව ද සමග වෙබ් අඩවියට උඩුගත (Upload) කළ යුතුය. (ඔබ විසින් කාර්යාල කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම්, ඒ බව බැංකුවට මුදල් ගෙවන කුවිතාන්සියේ වෙන වෙනම සඳහන් කළ යුතුයි.)

03. මෙ සම්බන්ධ සියළු විස්තර ඉහත සඳහන් වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැකි වන්නේ **2025 ඔක්තෝබර් 31 දින පෙ.ව. 09.00** සිට **2025 දෙසැම්බර් 15 දින ප.ව. 4.00** දක්වා පමණක් බව සලකන්න.

වැඩිදුර විමසීම් - හර්ෂණී මිය **075 - 8332330**
**011- 2368153**

**දිස්ත්‍රික් ලේකම්/දිසාපති,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,**
**ඇල්විටිගල මාවත,**
**නාරාහේන්පිට, කොළඹ 05.**